කොන්දේසි සහ නියමයන්

අවශ්‍යතාවය අනුව අන්‍යෝන්‍යයක් අවශ්‍ය නොවන්නේ නම් මෙම කොන්දේසි සහ නියමයන්හි ඇතුළත්,

(අ) "ගිණුම" යන්නෙන් එන්ඩීබී හර කාඩ්පත්‍රයක් සඳහා වූ අයදුම් පත්‍රයේ නිශ්චිතව අංකය සඳහන් සහ අදාළ පරිදි කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙන ලද කාඩ්පත දරන්නා නමින් බැංකුවේ ද්‍රාව්‍ය පවත්වාගෙන යන හෝ ඉදිරියේදී පවත්වාගෙන යනු ඉවත (තම තනි නමින් හෝ වෙනත් පුද්ගලයෙකු සමඟ බද්ධව) බැංකු ගිණුමක් හෝ ගිණුම් අදහස් වේ.

(ආ) ATM යන්නෙන් ලෝක ව්‍යාප්තව ඇති හර කාඩ්පත් භාර ගන්නා ස්වයංක්‍රීය රෙදාර යන්ත්‍ර අදහස් කෙරේ.

(ඇ) "බැංකුව" යන්නෙන් වෙළඳ නාමය වශයෙන් "එන්ඩීබී බැංකුව" යනුවෙන් භාවිත කෙරෙන කොළඹ - 2, නවම් මාවත් අංක 40 දරණ ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ජාතික සංවර්ධන බැංකුව පිළිබඳව සහ එහි අනුප්‍රාප්තිකයන් නියැදුම්ලාභීන් අදහස් වේ.

(ඈ) "කාඩ්පත් හිමියා" යන්නෙන් අදාළ බැංකු අධිකාර පත්‍රයට අනුව ගිණුම ක්‍රියාත්මක කිරීමට බලයලත් පුද්ගලයා/පුද්ගලයන් අදහස් වේ.

(ඉ) "පහසුකම" යන්නෙන් ATM ගනුදෙනු, ඒවා ගනුදෙනු සහ සම්බන්ධිත සියලු කාරණාවන් අදහස් වේ.

(ඊ) එන්ඩීබී හර කාඩ්පත්‍රය යන්නෙන් ඒවා කාඩ්පත හෝ ATM හෝ POS "විකුණුම් ස්ථානයේ" ව්‍යාපාර ගනුදෙනු කිරීම සඳහා කාඩ්පත් හිමියන්ට බැංකුව විසින් වෙනත් ව්‍යාපාර නාමයක් යටතේ නිකුත් කරන ලද කාඩ්පතක් හෝ එය අලුත් කිරීම සඳහා නිකුත් කරන ලද කාඩ්පතක් හෝ එ වෙනුවට නිකුත් කරන ලද ආරක්ෂිත කාඩ්පතක් අදහස් වේ.

(ඌ) "පින්" (රහස් අංකය) යන්නෙන් බැංකුව කාඩ්පත් හිමියෙකුට කාඩ්පතක් නිකුත් කිරීමේදී ලබාදෙන පුද්ගල හඳුනා ගැනීමේ අංකය හෝ එන්ඩීබී හර පත් ගනුදෙනු සම්බන්ධව මඟු හඳුනා ගැනීම සඳහා බැංකුව සමඟ විධිවිධානවලට අනුව මුල් අංකය වෙනුවට ලබාදුන් ආරක්ෂක අංකය අදහස්වේ.

(ඍ) 'POS' යන්නෙන් එන්ඩීබී හරපත් බාර ගත හැකි ලෝක ව්‍යාප්ත වෙළෙන්දෙන් වෙත ලබා දී ඇති විකුණුම් ස්ථානයේ ගනුදෙනු සඳහා වන පරිගණක අන්තයන් (Terminals) අදහස් වේ.

(ඎ) ගනුදෙනු යන්නෙන් ATM හෝ POS Terminals හරහා (Process) ක්‍රියාත්මක කළ හැකි සියලු ගනුදෙනු අදහස් වේ.
මෙම නියමයෙන් හා කොන්දේසි වල ඒක වචනයකින් එහි බහු වචනය සහ ප්‍රතිලෝමයද පුරුෂ වාචික වචනයකින් ස්ත්‍රී වාචික වචනය සහ ප්‍රතිලෝමය ද ඇතුළත් විය හැක.

2. එන්ඩීබී කාඩ්පත් හිමියන් විසින් එන්ඩීබී හරපත් බාර ගන්නා ලෝකයේ ඕනෑම තැනක සිටින වෙළෙන්දන් හෝ සැපයුම්කරුවන් වෙත ඇති කාඩ්පත් ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රයක් මගින් එන්ඩීබී හර පත්‍රයේ මුද්‍රිත අංකය සඳහන් කරමින් විකුණුම් වවුචරයක් අත්සන් කර ලබාදුන් බලය අනුව එහස් ලබා ගන්නා භාණ්ඩ හෝ සේවාව සඳහා වන ගෙවීන් බැංකුව ගිණුම හර කරනු ලැබේ.

3. කාඩ්පත් හිමියන්ට රහස්‍ය අංකය සමඟ එන්ඩීබී හර කාඩ්පත්‍රය යොදු ගනිමින් ATM යන්ත්‍රවලින් මුදල් ලබා ගැනීමට පාවිච්චි කළ හැකිය.

4. එන්ඩීබී හරපත් බාරගන්නා ඕනෑම බැංකුවකින් මුදල් ආපසු ලබා ගැනීමට හෝ බලයලත් ආයතන වලින් වවුචරයක් අත්සන් කර භාණ්ඩ හෝ සේවාව කාඩ්පත් දරන්නාට එන්ඩීබී හරපත්‍රය පාවිච්චි කළ හැකි අතර වැය වූ මුදලින් ගිණුම හර කරනු ඇත.

5. කාඩ්පත් දරන්නාට පහසුකම් සැපයීම බැංකුවේ පරම අභිමතය සහ කාඩ්පත් දරන්නාගේ අවදානම මත සිදු කෙරෙන අතර පහසුකම් යටතේ සිදු කෙරෙන සියලු ගනුදෙනු සඳහා ඔහු සෑම අවස්ථාවකම වගකිව යුතුවේ. පහසුකම මුලින් උපරිම ලෙස මාස 60ක කාලයකට ලබාදෙන අතර එම කාලය අවසානයේ පහසුකම අලුත් කිරීම බැංකුවේ පරම අභිමතය අනුව සිදු කෙරෙනු ඔබන අතර කෙසේ වෙතත් කාඩ්පත දරන්නාට කිසිම පුරව දැනුම්දීමක් නොකර ඕනෑම අවස්ථාවක පහසුකම ගුණ්ලා අත්කර ගැනීමෙන් හෝ අවලංගු කිරීමෙන් හෝ එන්ඩීබී හරපත්‍රය අලුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම මගින් පහසුකම් නැවැත්වීමට බැංකුවට නිදසන ඇත.

6. කාඩ්පත් දරන්නාගේ අභිමතය අනුව මෙම පහසුකම ආපසු ගැනීම සඳහා ඔහු විසින් දින 07ක පුරව දැනුම්දීමක් බැංකුව වෙත ලිඛිතව දිය යුතු අතර එන්ඩීබී හරපත්‍රය බැංකුවට බාරදී වලංගු වූ පත්‍රයක් ඒ සඳහා ඉල්ලා ගත යුතුය.

7. එන්ඩීබී හර කාඩ්පත සෑම අවස්ථාවකම බැංකුවේ දේපළක් ලෙස සැලකෙන අතර මෙම පහසුකම ප්‍රයෝජනයට ගැනීමට බැංකුව බලය පවරා ඇති කාඩ්පත දරන්නා එම කාඩ්පත් අනු පිටපත් ලබා ගැනීමට හෝ එහස් පිටපත් කිරීමකට අනුබල දීම නොකළ යුතුය.

8. ගිණුම වසා දැමුවහොත්/ගිණුම හිමියා මරණයට පත්වුවහොත් හෝ එන්ඩීබී හර කාඩ්පත්‍රය දරන්නා එය ආපසු භාරදීම අවශ්‍යයැයි බැංකුව අදහස් කරන ඕනෑම අවස්ථාවක එන්ඩීබී හර කාඩ්පත ආපසු බාර දෙන ලෙස ඉල්ලා සිටීම/පහසුකම ඉල්ලා අත්කර ගැනීම සඳහා බැංකුවට අයිතිය ඇත.

9. බැංකු ගිණුම යම් කිසි හේතුවක් නිසා වසා දැමුවහොත් බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් ඕනෑම පුද්ගලයෙකු විසින් එන්ඩීබී හර කාඩ්පත්‍රය අවලංගු කරන බව / ඉල්ලා අත්කර ගන්නා බවට දැනුම් දෙමින් අවලංගු කිරීම සඳහා කාඩ්පත්‍රය ආපසු බාරදෙන ලෙස දැනුම් දුන් විට කාඩ්පත දරන්නා එය පාවිච්චි කිරීමෙන් හෝ පාවිච්චි කිරීමට උත්සාහ කිරීමෙන් වැළකීමට බිහිස ගනී. පුද්ගලික රහස් අංකය (PIN) නිකුත් කර ඇත්නේ කාඩ්පත පාවිච්චි කිරීම සඳහා වන අතර එම අවශ්‍යතාවය සඳහා නිකුත් කරනු ලබන ආරක්ෂක අංක / අංකයන් ද ඉතාමත් රහසිගතය. පුද්ගලික රහස් අංකය PIN කුමන තත්ත්වයක් යටතේවත් කුමන මාර්ගයකින්වත් ස්ථිරීපාරවන් හෝ වෙනත් ආකාරයකට හෝ තෙවැනි පාර්ශ්වය හෙළිදරව් නොකළ යුතුය. තෙවැනි පාර්ශ්වයක් අතට පත් වුවහොත් කාඩ්පත භාවිත කළ හොඟකි වන පරිදි කාඩ්පත දරන්නා විසින් පුද්ගලික රහස් අංකය (PIN) පිළිබඳව කිසිම ලිඛිත සටහනක් තැබීම කිසිම ස්ථානයක හෝ කිසිම ආකාරයකින්වත් නොකළ යුතුය.

10. එන්ඩීබී හර කාඩ්පත ප්‍රයෝජනයට ගනිමින් කුමන ආකාරයකින් හෝ සිදුකර ඇති ඕනෑම ගනුදෙනුවක් පිළිබඳ කාඩ්පත දරන්නා ඕනෑම අවස්ථාවක වගකිව යුතු වන අතර එන්ඩීබී හර කාඩ්පත්‍රය හෝ අදාළ පුද්ගලික රහස් අංකය (PIN) ඕනෑම බලය රහිත පුද්ගලයෙකු විසින් කුමන ආකාරයකින් හෝ භාවිත කිරීමෙන් බැංකුවට සිදුවන සියලු අලාභහානි හානි පූරණය කළ යුතුය.

11. පහසුකම් භාවිත කළයුත්තේ එම පහසුකම සලසනු ලැබ ඇති කාඩ්පත දරන්නා වන අතර ඔහු එන්ඩීබී හර කාඩ්පත්‍රයේ ඒ සඳහා ඉඩකඩ සලසා ඇති ස්ථානයේ අත්සන තැබිය යුතුය. ඔහු විසින් සෑම අවස්ථාවකම එන්ඩීබී හර කාඩ්පත්‍රය නැගිමීම/කොටකින් කිරීම වැළැක්වීම සඳහා සහ තම පුද්ගලික රහස් අංකය (PIN) යම් බලය රහිත පුද්ගලයෙන් දැන ගැනීම වැළැක්වීම සඳහා හැකි සියලු ආරක්ෂාවන් සෑම අවස්ථාවකම යොදිය යුතුය. මෙම අවස්ථා 02ක් ඕනෑම අවස්ථාවක වහාම ඒ බව බැංකුවට දැනුම් දිය යුතුය. කාඩ්පත නැතිවූ බව / කොටකම් කළ බව හෝ පුද්ගලික රහස් අංකය (PIN) බලය රහිතව භාවිත කිරීම පිළිබඳව දැනුම් දීම ළඳ බව බැංකුව තහවුරු කරන තෙක් එන්ඩීබී හර කාඩ්පත භාවිත කරමින් සිදුකර ඇති සියලු ගනුදෙනු වල සම්පූර්ණ වගකීම කාඩ්පත දරන්නා භාරගත යුතුය.

12. එන්ඩීබී හර කාඩ්පත භාවිතා කරමින් සිදුකළ ඉහත කී සියලුම ගනුදෙනු සඳහා බද්ධ ගිණුම්කරුවන් සාමූහිකව සහ වෙන් වෙන් වශයෙන් වගකිව යුතුය.

13. එන්ඩීබී හර කාඩ්පත භාවිත හා සම්බන්ධ කර ඇති ගිණුම් අයිරා කිරීම හෝ මුදල් ආපසු ගැනීම, අරමුදල් මාරු කිරීම හෝ එන්ඩීබී හර කාඩ්පත භාවිත කරමින් වෙනත් ආකාරයකින් ගිණුමට ඇති ශේෂය හෝ එකඟ වූ අයිරා ශේෂය ඉක්මවා ගනුදෙනු කිරීම නොකළ යුතුය.

14. කාඩ්පත දරන්නා වෙත නිකුත් කර ඇති එන්ඩීබී හර කාඩ්පත පුද්ගලික රහස් අංකය (PIN) පවරා දීය නොහැකි අතර එය ඔහුගේම පමණක් ප්‍රයෝජනය සඳහාය. කාඩ්පත දරන්නා පුද්ගලික රහස් අංකය (PIN) ඉතාමත් රහසිගතව තබා ගැනීමේ වගකීමට යටත්වන අතර ඔහුගේ පුද්ගලික රහස් අංකය (PIN) කිසිම පුද්ගලයෙකුට කිසිම අවස්ථාවක කුමන තත්ත්වයක් යටතේ හෝ හෙළිදරව් නොකිරීමට පොරොන්දු වේ.

15. කාඩ්පත දරන්නාගේ බලය හෝ දැනුම සහිතව හෝ රහිතව එන්ඩීබී හර කාඩ්පත්‍රය උපයෝගී කර ගෙන සිදු කරන ලද කුට මුදල් ආපසු ගැනීමක්/මාරු කිරීමක්/ගෙවීමක් සම්බන්ධව ගැනෙන්න නම් කළ ගිණුම් හර කිරීමට බැංකුවට බලය පවරමි. කෙසේ වෙතත් බැංකුව විසින් වරින් වර කාඩ්පත දරන්නාට දැනුම් දෙනු ඔබන්නාවූ අරගතුත් කොන්දේසි වලට සහ ඕනෑම එක් දිනයක සිදුකළ හැකි ගනුදෙනුවල මුළු එකතුව සම්බන්ධව පනවා ඇති සීමාවන්ට යටත්වේ.

16. එහස් මුවින් එන්ඩීබී හර කාඩ්පත හෝ වෙනත් දේශීය පාලයක් උපයෝගී කරගෙන දේශීයව හෝ ජාතික්තරව සිදු කරන ගනුදෙනු සම්බන්ධව ගෙනතික හෝ වෙනත් ව්‍යවස්ථාපිත බෙහෙවින් ඇතැළු සියලුම වැය නම් කළ ගිණුමට ඉහත සඳහන් සීමාව නොඉක්මා හර කිරීමට බැංකුවට බලය පැවරේ.

17. ශ්‍රී ලංකාවේ වලංගු නොවන මුදල් එකකවලින් සිදු කරන ලද සියලුම කාඩ්පත් ගනුදෙනු පරිවර්තනය කරන දිනයේදී ඒසා ඉන්වරහැන්සල් විසින් අදාළ කරගනු ලබන විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර බැංකුව අය කරනු ලබන යම් අතිරික්ත ප්‍රතිශතයක් ද සමඟ ඒසා ඉන්වරහැන්සල් විසින් ගනුදෙනුව සඳහා බැංකුවන් අය කරන යම් ගාස්තුවක්/ගාස්තු ද සමඟ ගිණුමට හර කරනු ලැබේ.

18. යම් ගනුදෙනුවක් අවලංගු කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ මුදල් ආපසු ගෙවීම නිසා සිදුවන යම් විනිමය අලාභයක් වෙතොත් කාඩ්පත දරන්නා ඒ සඳහා වගකිව යුතුය.

19. බැංකුව සමඟ පවත්වාගෙන යන නම් කර ඇති ගිණුම්වල තත්ත්වය පිළිබඳව ස්වයංක්‍රීය රෙදාර යන්ත්‍රයේ ATM දර්ශන පටලයේ හෝ මුද්‍රිත විමසුම් තුන්ඩුවෙහි හෝ ස්වයංක්‍රීය රෙදාර යන්ත්‍රය නිකුත් කරන කුවිතාන්සියෙහි හෝ සඳහන් වන මුදල කුමක හෝ කරුණක් අරභයා නිරාකෘතික වෙනවලදී කාඩ්පත භාවිත කරමින් සිදුකළ ගනුදෙනු සඳහා සෘජු කෙරුනු බැංකුවේ ගනුදෙනු වාර්තාවේ අංක 11, 12, 13 සහ 14 යන කොන්දේසි වලට යටත්ව ඕනෑම කරුණක් සඳහා අවසානාත්මක සහ අනුගම්‍ය සාක්ෂියක් වන්නේය.

20. එන්ඩීබී හර කාඩ් පත භාවිත කරමින් සිදුකළ ගනුදෙනු පිළිබඳ වාර්තාවක් කාඩ්පත දරන්නාට යවන සාමාන්‍ය බැංකු ගිණුම් ප්‍රකාශනයේ අන්තර්ගත වන අතර කාඩ්පත දරන්නා විසින් එහි සෑම ගිණුම් ප්‍රකාශනයක්ම පරීක්ෂා කිරීම අවශ්‍ය වන අතර එහි ඇතුළත් වැරදි යැයි සැලකෙන සටහන් ගිණුම් ප්‍රකාශනයේ දින සිට දින 45ක් තුළ බැංකුවට දැනුම් දිය යුතු අතර එම කාල සීමාව ඉක්මවීමෙන් පසුව ගිණුම් ප්‍රකාශනය සහ එහි ඇතුළත් සටහන් (එහස් දැනුම් දුන් යම් වැරදි වේ නම් ඒවා හැර) සෑම කරුණක් සඳහාම බැංකුව සහ කාඩ්පත දරන්නා අතර නිවැරදි ලෙස අවසානාත්මක පිළිගත යුතුය.

21. පහත සඳහන් කරුණු පිළිබඳව බැංකුව වගකීම බාර නොගනී.

(අ) එන්ඩීබී හර කාඩ් පත්‍රය යම් වෙළඳ ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ හරු කිරීම හෝ බාර ගැනීමට හෝ බලයලත් මුළු සීමාව දක්වා පහසුකම සැසඳීමට අපොහොසත් වීම.

(ආ) එන්ඩීබී හර කාඩ්පත භාවිත කරමින් ලබාගත් භාණ්ඩ හා සේවාවන්හි දෝෂ හෝ අඩුපාඩු.

(ඇ) එන්ඩීබී හර කාඩ්පත භාවිත කරමින් ලබාගත් භාණ්ඩ මිලට ගැනීම හෝ සේවාවන් ලබා ගැනීමට කාඩ්පත් දරන්නන් පොළඹවාලීම හෝ උනන්දු කරවීම සඳහා කෙරෙන ප්‍රචාරණයේදී ප්‍රසිද්ධ කිරීමේදී, ප්‍රචාරධනය කිරීමේදී සිදු වූ හෝ අන්තර්ගත වී ඇති යම් සත්‍ය නොවන තිරදර්ශයන්.

(ඈ) බැංකුවේ හෝ වෙනත් අයකුගේ පාලනයෙන් තොර හේතු කරණ කොටගෙන ස්වයංක්‍රීය ATM යන්ත්‍රයේ සිදුවන සේවාවන් සඳහා බාධාවක් හෝ විඳවැටීම් හෝ දෝෂයක් හෝ සන්නිවේදන ක්‍රමයන්හි පද්ධති හෝ දත්ත සැකසුම් ක්‍රමයන්හි හෝ දත්ත සම්ප්‍රේෂණය කිරීමේ සම්බන්ධතාවයන්හි හෝ වෙනත් කාර්මික හෝ වෙනත් මොහොඳ හේතු කොට ගෙන සිදුවන ඕනෑම ආකාරයක අපහසුතාවයක්, අලාභයක්, හානියක් හෝ අපහසු තත්ත්වයක්

22. කාඩ්පත් දරන්නා එන්ඩීබී හර කාඩ්පත්‍රය පාවිච්චි කරමින් සිදු කරන සියලු ගනුදෙනු සෑම අවස්ථාවකදීම,

(අ) ගනුදෙනුව සිදු කරන අවස්ථාවේ බලපවත්වන විනිමය පාලන රෙගුලාසි වලට අනුකූල බව (කාඩ්පත දරන්නා එන්ඩීබී හර කාඩ්පත භාවිත කරමින් දේශීය සහ විදේශීය ඉල්ලීන් ලෝකය පුරා සිදු කරන ලද පුද්ගලික විගසියැළි ඇතැළුවව නමුත් එන්ඩීබී කාඩ්පතටම පමණක් සීමා නොවූ)
සහ

(ආ) ගෙනතික අවශ්‍යතාවය සඳහා අනුකූල බව තහවුරු කර ගත යුතුය. තෙවැනි පාර්ශ්වයන් වෙනුවෙන් කරන බාඩිර ගෙවීම් විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය කිරීමක් බව සටහන් කර ගත යුතුය.

23. මෙම කොන්දේසි හා නියමයන් කලින් කලට ඕනෑම ආකාරයකට බැංකුව සුදුසු යැයි සිතන ආකාරයට සංශෝධනය කිරීම/ වෙනස් කිරීම/මාරු කිරීම/ඉල්ලා අත්කර ගැනීම/අලුත් කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳ අයිතිය බැංකුව රඳවා ගනී. කාඩ්පත් දරන්නා වෙත දැනුම් දෙන ලිපියෙහි සඳහන් එහි සංශෝධන ක්‍රියාත්මක වන දිනයෙන් පසුව එන්ඩීබී හර කාඩ්පත්‍රය පාවිච්චි කරන්නේ නම් එම සංශෝධන විරෝධයකින් තොරව කාඩ්පත දරන්නා විසින් පිළිගත් ලෙස සැලකේ. කාඩ්පත දරන්නා එවැනි සංශෝධනය පිළිගනොගන්නේ නම් එන්ඩීබී හර කාඩ්පත්‍රය ආපසු බැංකුවට බාර දී ඒ සඳහා වලංගු කුවිතාන්සියක් ලබාගත යුතුය.

24. මේ යටතේ බැංකුවට ලැබෙන යම් අයිතිවාසිකමක් හෝ සියලු අයිතිවාසකම් කාඩ්පත දරන්නාගෙන් ඒ සඳහා අනුමැතියක් රහිතව වෙනත් පාර්ශ්වයකට නියැදි කිරීමට බැංකුවට අයිතිය ඇත.

25. දැනට පවත්නා නීති යටතේ බැංකුවට ලැබෙන සාමාන්‍ය හිඟපී කිරීම් අයිතියට අමතරව බැංකුව කාඩ්පත් දරන්නාට කිසිම දැනුම් දීමක් නොකර කාඩ්පත් දරන්නා විසින්ම පමණක් ක්‍රියාත්මක කරන සහ හිමිකම දරන ගිණුම් නම් කළ ගිණුම / ගිණුම් සමඟ සංයුක්ත හෝ එකාබද්ධ කරමින් කාඩ්පත් දරන්නාගේ මෙම පහසුකම යටතේ ඇති වගකීම පියවා ගැනීම සඳහා එම වෙනත් ගිණුම්වල ඇති බැර ශේෂ මුදල් හිඟපී කිරීමට බැංකුවට අයිතිය ඇත.

26. මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති අනුව සැකසුනු සහ ඒ අනුව පාලනය වන්නකි.

27. දුරකථන, රෙදෙක්ස්, ස්කේල්, ෆැක්ස් හා විද්‍යුත් තැපෑල මඟින් ලබා දෙන උපදෙස් සඳහා බලය පැවරීම සහ භාරදීපූරණය.

(අ.) උපදෙස් ඉවත අවස්ථාවේදී පවත්නා තත්ත්වයන් සැළකිල්ලට නොගෙන, මතු සඳහන් කරුණුවල සාමාන්‍ය අරුතට අගතියක් නොවන අලුරින් උපදෙස් දෙන හෝ දෙන බව කියන පුද්ගලයා සතු බලතල හා බලගත් භාවනුව පිළිබඳව බැංකුව පාර්ශ්වයෙන් කිසිදු විමසීමක් නොකරම කලින් කලට කාඩ් හිමියන් විසින් තමන් වෙනුවෙන් දුරකථනය, රෙදෙක්ස්, ස්කේල්, ෆැක්ස් හා විද්‍යුත් තැපෑල මඟින් ලබා දෙන හෝ ලබා දෙන බව කියන ඕනෑම දැන්වීමක්, උපදෙසක්, ඉල්ලීමක් හෝ අනෙක් සන්නිවේදනයක් (උපදෙස්) මත පිහිටා ඒ අනුව කටයුතු කරන ලෙස කාඩ්හිමියා බැංකුවට බලය පවරයි.

(අ.) කාඩ්හිමියා දෙන උපදෙස් පූර්ණව බලාත්මක බවට හා ඔහුව බැඳීමකට යටත් කරවන බවට සෑළසීමට බැංකුවට අයිතියක් ඇති අතර දෙනු ලබන උපදෙස් වල යම් වරදක්, ඒවිත්ව ඇරවයක්, වැරදි තේරුම් ගැනීමක් හෝ උපදෙස් වල අඩංගු කරුණු වල නොපැහැදිලි බවක් තිබියදී වුවද ඒ මඟින් යම් මුදලක් ගෙවීමට හෝ නොගෙවීමට, ඕනෑම ගිණුමක් හර හෝ බැර කිරීමට, සම්බන්ධ කිරීමට, මුදල් හෝ ලියකියවිලි මුදා හැරීමට හෝ බැංකුව හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු සමඟ කාඩ්හිමියා ඇති කරගත් ඕනෑම ගිවිසුමකට හෝ වෙනත් වැඩ පිළිවළසකට (ගිවිසුමේ හෝ වැඩ පිළිවළසුති ස්වභාවය හෝ අදාළ මුදල් ප්‍රමාණය ගැන සැලකිල්ලට නොගෙන) හෝ කාඩ්හිමියා බැඳීමකට යටත් කළ හැකි වෙනත් වරදකින ගනුදෙනුවකට හෝ කුමන හෝ වැඩ පිළිවළසකට එකී උපදෙස් සම්බන්ධයෙන් බැංකුව විසින් සෝයෙසායි අදහස් කරන පරිදි ඒ උපදෙස් මත පිහිටා යම් සුදුසු පියවරයන් ගැනීමේදද බැංකුවට අයිතිය ඇත.

(ඇ.) බැංකුව මෙම බලාත්මක කිරීමේ නියමයන් හා භාණ්පූරණය අනුව කටයුතු කිරීම සැලකිල්ලට ගෙන කාඩ්හිමියා මෙම උපදෙස් සම්බන්ධයෙන් හෝ ඒවා උල්ලංඝනය කිරීම නිසා හෝ මෙහි දක්වා ඇති පරිදි බැංකුව විසින් තම අයිතිවාසිකම් බලාත්මක කිරීම හේතු කොට ගෙන කුමන අයුරකින් හෝ පැන නැගිය හැකි හා බැංකුවට දැරීමට සිදුවන ඕනෑම ආකාරයක නීතිමය හා වෙනත් සියලු අලාභ, ආරක්ෂයන්, ක්‍රියාවන්, නීති කතෘයන්, ඉල්ලීම්, හානි, පිරිවැය, වගකීම් හා වියදම් වෙනුවෙන් බැංකුවට භාණ්පූරණය කිරීමටත් ඒවාට අරගඹිව බැංකුවට වන්දි ගෙවීමටත් කාඩ්හිමියා නැවත වෙනස් කළ නොහැකි වන ලස් මෙයින් බාර ගනී.

(ඈ.) කාඩ්හිමියා වෙතින් සමාජන කිරීමේ නිවේදන බැංකුවට පොලාඹෙන තාක් කල් හා ඒ අනුව කටයුතු කිරීමට සාධාරණ කාලයක් ලැබෙන තාක් කල් එකී නිවේදනය ලැබීමට පෙර මෙම බලාත්මක කිරීමේ, නියමයන් හා භාණ්පූරණය පරිදි සිදු කරන ලද ඕනෑම ක්‍රියාවක් වෙනුවෙන් කාඩ්හිමියා මෙම බලාත්මක කිරීමේ හා භාණ්පූරණය කිසිදු වගකීමකින් නිදසන් නොකරන්නේ නම් හර මෙම බලාත්මක කිරීමේ නියමයන් සහ භාණ්පූරණය පූර්ණ බලය හා අනුඅලය ඇතිව බල පවත්වනු ඇත.

(ඉ.) ඉහතින් සඳහන්ව ඇති පරිදි දුරකථනය, රෙදෙක්ස්, ස්කේල්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මඟින් ලබා දෙන උපදෙස්, බැංකුවට උපදෙස් දීමට යොදා ගන්නා සුරක්ෂිත ක්‍රමයක් නොවන බව කාඩ්හිමියා පිළිගන්නා අතර එහිදී ඇතිවන අවදානම පිළිබඳව කාඩ්හිමියා දැන සිටින බවත් කාඩ්හිමියාගේ පහසුව සඳහා මෙහි දක්වා ඇති වැඩපිළිවෙළකින් තනි වගකීම කාඩ්හිමියා සතු බවත් තහවුරු කරයි.